# ජාතක මාලාවට ප්‍රස්තාවනාවක්.

ආචාර්ය කරගස්වැවේ විමලානන්ද හිමි.

බුදුරජාණන් වහන්සේ බෝධිසත්ත්ව වරයෙකු වශයෙන් තමන් වහන්සේගේ පෙර විසූ කඳ පිළිවෙළ හෙළි දක්වන කතාපුවත් තිස් හතරක් රැගත් ජාතකමාලා නම් වූ ග්‍රන්ථය බෝධිසත්ත්වාවදනමාලා යන අපර නාමයකින් ද හඳුන්වනු ලැබේ. මෙහි ඇතුළත් කතා පුවත් බෝධිසත්ත්වයන්ගේ මහාකරුණා ගුණය උද්දීපනය කරයි. එබැවින් මිනිස් හදවත්හි ගැඹුරු පත්ලේ පිහිටි මහඟු කරුණා නිධානය මේ කතා මගින් ඔප්නංවා ඉදිරිපත් කෙරේ යයි සඳහන් කරමු. මෙම ජාතක කථාවන් ම අවදන යයි නම් කරන්නේ බෝධිසත්ත්වවරයෙකුගේ උදර, ධීර, වීර චරිත ලක්ෂණ ද උගන්වන බැවිනි. බුද්ධත්ව ප්‍රාප්තිය සඳහා පිරිය යුතු පාරමිතාවන්ගේ මහනීය බව අවබෝධ කරවීම මේ කතාවන්ගේ ප්‍රධාන පරමාර්ථයයි. සෑම කතාපුවතක ම ආරම්භයේ එය දේශනා කිරීමේ පරමාර්ථය කුමක් දැයි දැක්වේ. ඉන් අනතුරුව දැක්වෙන්නේ - තද්‍යථානුශ්‍රූයතෙ - එම කතාපුවක යම්සේ අසන්නට ලැබේද ඒ මෙසේය. යන වාක්‍යය යි. තවත් විශේෂත්වයක් නම් එකිනෙක කතාවස්තුවක පරමාර්ථය කතාපුවත තුළ කෙසේ නම්, විග්‍රහකර දක්වන ලද්දේ ද යන්න කතාවන්හි අවසානයේ ද සඳහන් කර තිබීමයි. කර්න් මහතා පවසන්නේ කතාවස්තුන්හි එන පරමාර්ථය හැඳින්වීමේ කොටස පසුව එක්කාසු කරන ලද්දක් බවයි.[1] නවීන විචාර කලාව අනුව කතාවක පරමාර්ථය කුමක්දැයි තෙමේ ම හෙළි දැක්වීම යෝග්‍ය වූවක් නොවේ. මේ පිළිබඳව අදහස් දක්වන පරශුරාම් මහතා කතාපුවත්හි පරමාර්ථය හෙළි දැක්වීම යෝග්‍ය වූවක් බවත් අතිශයින් අවශ්‍ය වූවක් බවත් සඳහන් කරන්නේ විවිධ හේතු සාධක දක්වමින්ය.[2] ධර්මදේශනාමය කතාපුවත්හි එය යෝග්‍ය වූවක් බව අපේ ද හැඟීමයි.



ඒ මේ මතිමතාන්තර කෙසේ වූවත් මෙකී කතාපුවත් හුදෙක් සාමාන්‍ය පාඨක ජනයාට පමණක් නොව විද්වත් සමූහයාට ද ප්‍රයෝජනවත් පරිදි රචනා කර ඇති බවනම් පැහැදිලිය. මෙම රචනාවන්හි මුඛ්‍ය පරමාර්ථය ද එයම විය.[3]

ශීල සමාධි ප්‍රඥවන්හි උදරත්වයත්, සංසාරයේ අනිත්‍යතාව, සංස්කාරයන්ගේ ක්ෂණ භංගුරත්වය, ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායට අනුව උත්පාද, ස්ථිති, භංගත්, කර්මසිද්ධාන්තයත් පිළිබඳවූ විග්‍රහයන් මූලික බුදුසමයේ ප්‍රමුඛ පෙළේ ඉගැන්වීම් විය. මෙම ඉගැන්වීම් සරල සුගම ශෛලියකින් ඉදිරිපත් කිරීම ජාතකමාලාවේ පරමාර්ථයයි.

අප හමුවේ ඇති ජාතක කතා සමූහයේ මූලය සූත්ත පිටකයේ ඛුද්දක නිකායට අයත්ව පවතී. ආචාර්ය පාළසබල් සම්පාදනය කරන ලද සංග්‍රහයේ ඇති ජාතක කතා සංඛ්‍යාව 547 කි. ක්‍රි.පූ. පළමුවැනි හෝ දෙවැනි සියවසේ සංගෘහිත යයි සැලකෙන චූල්ලනිද්දේසයේ සඳහන් ජාතක කතා සංඛ්‍යාව 500ක් පමණි.[4] චීන ජාතික පාහියන් ක්‍රිස්තු වර්ෂයෙන් 500 වැනි සියවසේ ලංකාවෙහිදී ජාතක කතා සිතුවම් 500ක් දුටුබව වාර්තා කරයි.[5] ගුප්ත යුගයේදී සංස්කෘතයේ ප්‍රසිද්ධ බෞද්ධ ග්‍රන්ථයක් වන ජාතකමාලවට අයත් කතා පුවත් ප්‍රචලිතව තිබුණි. ප්‍රසිද්ධ විද්වත් (ටිබැට් ජාතික) තාරානාථ විසින් මේ ග්‍රන්ථයේ රචකයා ආර්යශූර යයි නම් කර ඇත. මහාවස්තු නම් වූ මහාසාංඝික ලෝකොත්තරවාදීන්ගේ විනය ග්‍රන්ථයෙහි ඇති ජාතක කතා ප්‍රමාණය 80 කි. ලංකා, සියම්, බුරුම, ඉන්දියානු චීන ආදි දේශයන්හි ථෙරවාදී සම්ප්‍රදයයට අනුව ජාතක කථා සංඛ්‍යාව 550 කි. කෙසේ වූවක් දැනට අප සතුව ඇත්තේ ජාතක කතා 547 ක් පමණි. සංඛ්‍යාවන් මෙසේ ප්‍රමාණ කරතත් ජාතකපොතෙහි සඳහන් සෙසු අතුරු කතාත්, ඊට අන්තර්ගත නොවූ ථෙරවාදී සූත්‍ර, විනය පිටකයන්ට අයත් ජාතක ස්වරූපයේ කතාත් එක්කොට ගන්නේ නම් කතා සංඛ්‍යාව දහසකටත් අධික වේ. ඊශානචන්ද්‍ර සෝෂ් නම් විද්වතාගේ ගිණීම අනුව ජාතක කතා තුන්දහසක් පමණ වේයැයි පිළිගැනේ. සංස්කෘත ජාතකමාලාහි ආර්ශූර විසින් හුදෙක් භාග්‍යවත් බුදුරදුන්ගේ පූර්වජන්ම හා සම්බන්ධය

පවත්වන කතාවන්ම රචනා කර ඇත. ජාතකට්ඨ කථාවේ මෙන් එහි වර්තමාන කතාවක් දක්නට නැත. සැබවින් ම ජාතක නාමයෙන් ගත හැක්කේ ද පූර්වජන්මය හා සම්බන්ධ කතාපුවත් පමණකි. ජාතක මාලාවේ මුළු ජාතක සංඛ්‍යාව 34කි. ඒවාට යමක් පාළියෙන් ගන්නා ලද ද එම කතාවන්හි ප්‍රධාන කොටස් හැර කතුවරයා විසින් තැනින් තැන එක්කාසු කරන ලද කොටස් ද හමුවේ.

බෞද්ධ ධර්මයත්, දර්ශනයත් ඇසුරු කොටගෙන කාව්‍යරූපයෙන් රචනා කරන ලද සංස්කෘත ග්‍රන්ථ අතර ආර්යශූරයන්ගේ ජාතකමාලාව ප්‍රසිද්ධියට පත් අගනා කෘතියකි. කාව්‍යග්‍රන්ථයකි. සජීවී සංස්කෘතික ලක්ෂණ රැසක් හෙළි දක්වන්කි. කරුණාව හා මෛත්‍රිය පදනම් කරගත් ධර්මදේශනා මාලාවකි. මානව වර්ගයාට පමණක්, නොව සියලූ ලෝවැසියන්ගේ ම හිත පිණිස කරුණාවේ මහිමය ඉගැන්වූ කථාගතයන් වහන්සේගේ උත්තම දේශනා මෙහි ඇතුළත් වී පවතී. තෘෂ්ණාවට වහල් වූ කනක කාමිනී කීර්තිරූපී දෘඪතර බන්ධනයන් ලිහිල් කර සිඳ දමන ඥාන, කරුණා, ප්‍රේමාදර ආදි සද්ගුණ ජනයාගේ සිත්වල ස්ථිර කරවීම පිණිස ජාතකමාලාහි කථාවන් උපස්ථම්භක වේ. ධන - නිර්ධන, උස් - පහත්කම් ආදි සාමාජික ද්වන්ද්වයන්ගෙන් තොරව සරල සුගම භාෂා ශෛලියකින් මේ ග්‍රන්ථය රචනා වී ඇත. මෙම කතාවන්ගෙන් ලැබෙන ශික්ෂණයෙන් අද දක්වාත් අප්‍රමාණ ලෝකවාසීහු බුදුරදුන් ඉමහත් ආදර ගෞරවයෙන් සිහිපත් කරති. භාග්‍යවත් බුදුරාජාණන් වහන්සේ යම්බඳු ගුණ සමුදයකින් දීප්තිමත්ව විසීද උන්වහන්සේගේ එම දීප්තිය වර්තමාන බෝසත් වරුන්ගේ හිත පිණිස යෙදවීමට ජාතක මාලාව මහෝපකාරී වේ. ආර්යශූරයෝ බුද්ධාවවාදයන් සරල කතාවන්ගේ රූපයෙන් මිනිස් සිත්වල අංකිත කරලීම පිණිස අගනා උත්සාහයක් ගනිති. බෞද්ධ සිද්ධාන්ත කෝමල කාන්ත පදවලියකින් ඉදිරිපත් කිරීම ආර්යශූරගේ එක් විශේෂත්වයකි.

ජාතක මාලාහි ගද්‍ය සහ පද්‍ය දෙකේ ම සන්නිවේශයක් වේ. ස්වකීය පූර්වවර්ති කථා සාහිත්‍යයට අයත් පංචතන්ත්‍ර ආදි ග්‍රන්ථයන්ගෙන් ආදර්ශ ගෙන රචනා කරන ලද්දකි. පංචතන්ත්‍ර රචනයෙන් පසුව තදශ්‍රිතව විකසිත වූ සංස්කෘත ගද්‍ය ශෛලියේ



ඓතිහාසික සමාලෝචනයක් කිරීමේදී ජාතකමාලාවේ උපයුක්ත භාෂාව අතිශයින් උපකාරී වේ. එහි ඇති පද්‍යයන් නීතිශාස්ත්‍රීය උපදේශයන්ගේ විශේෂතා සඳහා නිදසුන්ය. ඉහත කී දෘෂ්ටිකෝණ දෙකින්ම මේ කෘතිය අනර්ඝය. මහා කාව්‍ය කරණයෙහි නිපුණ අශ්වඝෝෂයන්ට තරම් ඒකීය වස්තු බීජයක් ආර්යශූරයන්ට නොලැබුණු බව සත්‍යයකි. ජාතකමාලාවේ එක් එක් ජාතකයක් ස්වතන්ත්‍රව තිබීම ඊට එක් හේතුවකි. ආර්යශූරයන්ට ජාතකමාලාවේ කථාවන් සඳහා පාළි ජාතකයන්හි ඇතුළත් විෂය වස්තු ඒ ස්වරූපයෙන් ම හමු වී ඇත.

ජාතකමාලාවේ විශේෂතා රාශියකි. විශ්ව සාහිත්‍යයේ මෙම කෘතියට වෙන්වූ විශේෂත්වයක් ඇතැයි කිවයුතුය. මේ ග්‍රන්ථයේ පාත්‍රයන් වන දෙවි-දේවතාවන්, යක්ෂ - ප්‍රේතාදීන් හැරුණු විට පෘථිවියෙහි ජීවත්වන සාමාන්‍ය සත්ත්ව වර්ගයාද චරිත නිරූපණයෙහි ලා ඉවහල් වේ. ඇත්, මුව, වඳුරු, වලස්, සිංහ, ව්‍යාඝ්‍ර, මොනර, හංස ආදි ජීවීන්ගේ පැවැත්ම අන් සියලූ සතුන්ට වඩා සචේතනික බවින් උසස් මානවයාගේ ජීවිතය හා බැඳී පවතී. මෙහි ඇතුළත් සතුන් පිළිබඳ කතාපුවත් කියැවීමේ දී පැහැදිලි වන දෙයක් නම් මානවයාගේ පවුල වඩාත් පුළුල් වූවක් බවයි. එම පවුලේ සෑම ආකාරයේ ජීව - ජන්තූන්, කීට - පතංගයන්, ප්‍රේත - පිශාචයන්, යක්ෂ - කින්නරයන් ද ඇතුළත් වේ. මානවයා තනිවූවකු නොව ඔහු ජලචර, ථලචර, නභචර සියලූ සතුන් සමග ජීවන මගේ ගමන් කරන්නෙකි.

ජාත්කමාලවේ කථාවන් සියලූම ජීවින් ඒකීයත්වයකින් බැඳ තබයි. මෛත්‍රිය යනු හුදෙක් මිනිසෙකු විසින් මිනිසෙකුට පමණක් පැවැත්විය යුතු ගුණයක් ම නොව මිනිසෙකු විසින් තමාට ස්වභාවයෙන්ම සතුරුවූ සිහ, කොටි, වග, වලස් ආදි සතුන් කෙරෙහිද පැතිර විය යුතු ගුණයකි. ඒ අනුව අපි සැපසේ ජීවත්වනු කැමැත්තමෝ නම්, සියලූ සත්ත්ව ප්‍රජාව කෙරෙහිම මෙත් සිත පැතිර විය යුත්තෝ වෙමු. එබැවින් ජාතකමාලාව මානවදයාව (පමණක්) නොව භූතදයාව උගන්වන කෘතියකි. රාමායණ, මහාභාරත ආදියෙහි ප්‍රධාන වශයෙන් ප්‍රාණීන් හුදෙක්

තමාගේ ම කර්මවිපාක විඳින්නෝය. ප්‍රාණීහු නම් මිනිසාගේ හිතාහිත දෙකෙහි සමග ජීවත් වන්නවුන් වීම මෙකී ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන්නේ නමුදු ජාතකමාලාහි සියලුම ප්‍රාණීන් තම තමාගේ පාරස්පරික මෛත්‍රිය ඔවුනොවුන් කෙරෙහි දැක්වීම එහි විශේෂතාවකි.

'ජන්' ධාතුවෙන් පරව භාවාර්ථක 'ක්ත' ප්‍රත්‍යය යෙදී අනතුරුව ස්වාර්ථයේ 'ක' ප්‍රත්‍යය යෙදීමෙන් - 'ජාතක' ශබ්දය සෑදී ඇත. එහි ශබ්දාර්ථය නම් - ගතවූ ජන්මයේ කතාව - යනුයි. විකාසවාදී සිද්ධාන්තයන්ට අනුව කිසියම් ප්‍රාණියෙකුට ජීවන් මුක්ත (මෝක්ෂයට පත්වීම) වීම සඳහා ආත්මභාව ගණනාවක් තිස්සේ කරනු ලබන පුණ්‍යසංස්කාර හේතු සාධක වේ. බුදුරදුන්ද කිසියම් එක් අත්බැවෙක ශුභකර්ම නිසා එම උත්තරීතර තත්වයට පත්වූයේ නොවෙයි. ඒ සඳහා උන්වහන්සේ චතුරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම්දම් පිරූබව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඒ කාලපරිච්ඡේදය උන්වහන්සේ ගේ බෝධිසත්ත්ව සමයයි. 'බෝධි' යනු බුද්ධත්වය සඳහා යෙදෙන ශබ්දයයි. සත්ත්ව යන්නෙන් ජීවී, ප්‍රාණී යන අරුත් දෙයි. එබැවින් 'බෝධි සත්ත්ව' යනු බුද්ධත්වය සඳහා ප්‍රයත්නශීල සත්ත්වයා යනුයි. එබැවින් බෝධිසත්ත්වයාට අනාගත බුද්ධ කියාද නම් කළ හැකි වෙයි. මිලින්ද ප්‍රශ්නයට අනුව රහතුන් වහන්සේ හුදෙක් තම දුක්ඛ විමුක්තිය සඳහා උත්සුක වන්නේය. බෝධිසත්ත්ව වරයෙකුගේ ප්‍රධාන කාර්ය වන්නේ ආධ්‍යාත්මික වශයෙන් රහතුන්ගේ සංකීර්ණත්වයෙන් ඔබ්බට යාමයි.[7]

බෝධිසත්ත්ව සංකල්පය ප්‍රධාන වශයෙන් මහායාන සම්ප්‍රදායයේ විකාශනය වූවකි. මහායාන ධර්මය අනුවද 'බෝධි' යනුවෙන් බුද්ධත්වය ම අපේක්ෂිත බැව් බහුල වශයෙන් විද්වතුන්ගේ පිළිගැනීමයි. එහෙත් 'සත්ත්ව' ශබ්දයට අරුත් සැපයීමේදී විද්වතුන්ගේ ඒකමතිකත්වයක් නොමැත. හර්දයාල් තම ග්‍රන්ථයේ 'සත්ත්ව' ශබ්දයට විවිධාර්ථ දී ඇත. සත්ත්ව ශබ්දයට විද්වතුන් ඉදිරිපත් කරන අරුත් කීපයක් මෙසේය.



1. මෝනියර් විලියම්ස් - 'සත්ත්ව (නපුං) බුද්ධි, ප්‍රකෘති, චරිත්‍ර, ඥාන යනුවෙන් අරුත් සපයයි. ඒ අනුව බෝධිසත්ත්ව යනු පූර්ණ ඥානය ඇති, ප්‍රකෘතියෙන්ම ඥානමය සත්ත්වයායි.[8]

2. පාළි සත්ත (පුං) යනු සජීවී පදාර්ථයයි. ජීවත්වන කුමන හෝ ජීවියෙකු යනුයි. මේ අර්ථය වඩාත් යෝග්‍ය වූවකි. සමාධිරාජ සූත්‍රයේ මෙම අරුත ම ආධාර කරගනිමින් - බෝධති සත්ත්වාන් ඉති බෝධිසත්ත්වඃ - යි අර්ථකථනය කරයි. සතසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා සූත්‍රයෙහි - බොධිඃ ස වාසෞ මහා කෘපාශයෙන සත්ත්වාවලම්බනාත් සත්ත්වශ්චෙති[9] යනුවෙන් මනුෂ්‍යයා ම 'බෝධි' සහ 'සත්ත්ව' වේ යැයි පවසයි.

3. සත්ත්ව යන්නෙහි අර්ථයඃ-ආත්මය, මනස, ඉන්ද්‍රිය, චෙතනා යි. පාළි සත්ත යනු අත්ත ශබ්දය හා බැඳෙන්නෙකි. ප්‍රඥාකරමති බෝධිචර්යාවතාර ටීකාවෙහි මෙසේ සඳහන් කරයි. තත්‍ර (බොධෞ)[10] සත්ත්ව අභිප්‍රායෝස්‍යෙති බෝධිසත්ත්වඃ - යනුවෙන් 'සත්ත්ව' අර්ථය අභිප්‍රාය, වශයෙන් දක්වයි. තවදුරටත් ප්‍රඥාපාරමිතා සූත්‍රයෙහි -[11] බොධෞ සත්ත්වඃ අභිප්‍රායො යෙෂං තෙ බෝධිසත්ත්වඃ යමෙකුගේ සිත ප්‍රවෘත්ති, විචාර සහ අපේක්ෂාත් බෝධිය කෙරෙහි කේන්ද්‍රිය වූයේ ද ඒ බෝධිසත්ත්වයි - පවසයි.

4 සත්තා (සංස්කෘත) ශබ්දය අධිකාරාර්ථයක් දෙයි. එයින් ගර්භ, ගුප්ත, අඥාත, අව්‍යක්ත යන අරුත් පැවසේ. ඒ නයින් බෝධිසත්ත්ව යනු බෝධි ඥානය අව්‍යක්තරූපයෙන් තමා තුළ පවත්වන පුද්ගලයා ගැනේ.[12]

එම්. කේන් විසින් 'බොධි' ශබ්දයේ සාංඛ්‍ය යෝගී 'බුද්ධි' ශබ්දය හා සමානාර්ථයක් ගැබ්වී ඇතැයි පවසා ඇත. 'බුද්ධිසත්ත්ව' ශබ්දය යෝග සාහිත්‍යයේ හමු වන්නකි. ඇතුළත පවත්නා බුද්ධියේ මානවීය රූපය[13] (Personification of potential intelligence) ඉන් අපේක්ෂිතය. නමුත් මේ අරුත බෞද්ධයන්ගේ බෝධිසත්ත්ව ශබ්දය සඳහා යෙදීම අයෝග්‍ය වේ.

'බෝධි' යනු උත්තරීතර ඥානය හා සම්බන්ධ වූවකි. මෝනියර් විලියම්ස් ශබ්දකෝෂයේ සත්ත්ව යනු ශක්ති, බල, උද්යෝග, උත්සාහ සඳහා යෙදෙන්නකි. ඒ අනුව යමෙකුගේ ශක්තිය බොධිය දෙසට අභිමුඛව අවධියෙන් පවතීද ඒ බෝධි සත්ත්ව යි.

මෙකී මාතිමතාන්තර අනුසාරයෙන් අර්ථවත් වන්නේ බෝධිසත්ත්ව යනු එම අවස්ථාව (බෝධිසත්ත්වභූමිය) උදකර ගැනීම සඳහා අධ්‍යාත්මවීරත්වයෙන් ක්‍රියාන්විත පුද්ගලයායි. ඒ සඳහා යෙදුණු සාධකයන්ගේ (සිද්ධිය අපේක්ෂා කරන්නවුන්ගේ) ජීවිතයේ ලක්ෂ්‍යය අතිශයින් උදාත්ත, මහනීය වූවකි. ඔවුන් ජීවත් වීමේ අර්ථය ලෝකයේ පරම කල්‍යාණකාරී ශාන්තියක් උදකරවීමයි. විශ්වයේ ඒකමාත්‍ර ප්‍රාණියෙකු හෝ දුකින් පෙළේ නම් ඔහු ඉන් නිදහස් කරගන්නා තුරු බෝධිසත්ත්ව සාධකයා තම විමුක්තිය නොකැමැති වේ. මේ සඳහා ප්‍රඥාපාරමිතා[14] පුරණය ම බෞද්ධයන්ගේ ප්‍රධාන ආචරණය වේ.

ජාතකමාලාවේ අපරනාමයක් වන බෝධිසත්ත්වාවදනමාලා - ප්‍රයෝගය පිළිබඳව විමසා බලතහොත්, අවදන ශබ්දය 'සුකර්ම' සඳහා යෙදෙන්නක් බව සඳහන් කළ යුතුය. එබැවින් බෝසතුන්ගේ යහපත් කම් හෙළි දක්වන කෘතියක් ලෙස මෙය අගය කළයුතු වෙයි. අවදන නම් වූ විශාල සාහිත්‍යයක් බෞද්ධ සංස්කෘත ග්‍රන්ථාවලියේ හමුවේ. එම සාහිත්‍ය ලක්ෂණ ජාතකමාලාවේ ද නො අඩුව විද්‍යමාන වේ. මෙහි බුදුරදුන්ගේ පූර්වජන්ම කථා ඇතුළත්ය. මෙම කතා පුවත්හි එක් මුඛ්‍ය අංශයක් නම් - බුදුරදුන් වර්තමාන සිදුවීම් වල සමෝදනය දැක්වීමයි. මෙසේ කතාපුවත් දෙකක් එක් කොට කීම ජාතක පොතේ දක්නා පිළිවෙළයි. අවදන සාහිත්‍යයේද එම ලක්ෂණය විද්‍යමාන වේ.

බුද්ධ අවස්ථාවෙහි පමණක් නොව බෝධිසත්ත්ව අවස්ථාවන්හි ද පූර්වජන්මගත සිද්ධීන් ස්මරණය කිරීමට එතුමෝ සමත් වූහ. වරෙක කෝසල දේශයේ රජු වශයෙන් ඉපැදි බෝසත් තෙමේ තම අතීතජන්මය ස්මරණය කරමින් මින් පෙර අත් බවෙක තමන් කම්කරුවකු වශයෙන් උපත ලැබ භික්ෂූන් වහන්සේට දන්පැන් පිළිගැන්වූ බවත් ඒ පිනින් ඊළඟ ආත්මයේ (වර්තමානයේ)



කොසලදේසාධිපති වූ බවත් දේශනා කරයි.[15] එතුමන්ගේ බිරිඳ බෝධිසත්ත්වයෙකු නොවූවත් තම ස්වාමියාගේ මහිමය නිසා හෝ ඇගේ පෙර අත්බව සිහිපත් කිරීමට සමත් වූවාය. ඇය මෙසේ කියයි. පෙර ආත්මභාවයක මා දසියකව සිටියා. එක් මුනිවරයෙකුට භෝජනදානයක් දී කොසොල් රජුගේ බිසොව බවට පත්වූවා.[16]

බෝසතුන් විවිධ ජාති (ගොත්‍ර) වල උපත ලබා ඇත. උදහරණ වශයෙන්, රජ,[17] ඇදුරු,[18] බ්‍රාහ්මණ,[19] තපස්වී,[20] පිරිවැජි,[21] සිටු,[22] නාවික,[23] වශයෙන් ද, ශක්‍ර [24] වශයෙන්ද, වග,[25] සා,[26] මසු,[27] මුව,[28] වඳුරු,[29] වශයෙන්සද උපත ලද්දේය. එසේම කුමන හෝ ජාතියක උපත ලැබුවත් බෝසත් තෙමේ බාලකාලයේ පටන් ධීර, වීර ගති ඇති චතුරයෙක් වේ. ස්වල්පකාලයකින් ම සෑඩ ගුණයන්ගෙන් යුතු අයෙකු බවට පත්වේ. බඩසයින් පෙළෙන්නෙකුට තම සිරුර පවා ආහාර කොට දී දේහත්‍යාග කිරීමට තරම් ගුණෝපසම්පන්න වූ අවස්ථාද වේ.[30] තම සියලු වස්තුව දන්දී අනතුරුව ස්වකීය ශරීරාංග ප්‍රසන්න මනසින් යුතුව ප්‍රදානය කළ අවස්ථා ද වේ.[31] දන්දීම වලක්වා ලීමට විවිධ භයානක විපත්ති එලඹ සිටියේ නමුදු නොපසුබටව, නොසැලී තම කාර්යය ඉටු කළ අවස්ථා ද වේ.[32] අතරක් නැතිව ඉන්ද්‍ර විසින් තපසින් යුතු බෝසතුන්ගේ ආහාරය සඟවා තැබිණි. එහෙත් එතුමාණන්ට කිසිදු මනොවිකාරයක් ඇතිකරවීමට අසමත් විය.[33] බෝසතුන්ගේ උත්තම ආචරණය කුමන අර්ථයක් සඳහා දැයි යනු එතුමන්ගේ ම ප්‍රකාශනවලින් පැහැදිලි වේ. උදහරණ,

නායංප්‍රයත්නඃ සුගතිං මමාප්තුං
නෛකාතපත්‍රාං මනුජේන්ද්‍රලක්ෂ්මීම්
සුඛප්‍රකර්ෂෛකරසාං න ච ද්‍යාං
බ්‍රාහ්මීං ශ්‍රියං නෛව න මොක්ෂ සෞඛ්‍යම්.

යත්ත්වස්ති පුණ්‍යං මම කිංචිදෙවං
කාන්තාරමග්නං ජනමුජ්ජිහීර්ෂොඃ
සංසාරකාන්තාරගතස්‍ය තෙන
ලොකස්‍ය නිස්තාරයිතා භවෙයම්.

ජා.මා. 30.21-22

(මාගේ මේ ප්‍රයත්නය ඒකච්ඡත්‍ර රාජ්‍යසම්පත්තිය, සද්ගතිය, ස්වර්ගය, බ්‍රහ්මලෝකය හෝ මොක්ෂ සුඛය ලැබීම සඳහා නොවේ.

කාන්තාරයේ අතරමං වූ මිනිසකු ඉන් මුදවා ලනු කැමැත්තෙමි. මෙයින් මට කිසියම් පුණ්‍ය ඵලයක් ලැබෙන්නේ නම්, ඒ බලයෙන් ද මම සංසාරය නමැති කාන්තාරයෙහි නිමග්න වූවන් නිදහස් කරන්නට සමර්ථයෙක් වන්නෙමි.)

නායං යත්නඃ සර්වභෞමත්වමාප්තුං
නෛව ස්වර්ගං නාපවර්ගං න කීර්තිම්
ත්‍රාතුං ලොකානිත්‍යයං ත්වාදරො මෙ
යාං චාක්ලෙශො මා ච භූදස්‍ය මොඝඃ

ජා.මා. 2/28

(මාගේ මේ ප්‍රයත්නය මුළු ලොවේ ආධිපත්‍යය, ස්වර්ගය, අපවර්ගය (මොක්ෂය) හෝ යශස් ලැබීමට නොව ලෝකවාසීන් රක්ෂා කිරීම පිණිසය - එබැවින් යාචනය කරන්නාවූ මොහුගේ ප්‍රාර්ථනය අසඵල නොවේවා)

ජාතකමාලවේ නායක චරිතය වන බෝසතුන්ගේ ක්‍රියාවන් දිව්‍යමය, අද්භූත දේය. එතුමන්ගේ ජීවිතය අලෞකික මෙන්ම ආදර්ශ සම්පන්න වූවකි. ඒ සදචාරී පැවැත්ම සියලූ ජනයාට විමුක්තියේ උපදේශකි.

ආයඝීශූර ජාතකමාලවේ කර්තෘ වරයායි. ඔහු විසූ කාලය නිශ්චිත වශයෙන් දැක්විය නොහැක. එබැවින් ඒ සඳහා බාහිර සාධක ඉවහල් කරගත හැකිය. ජාතකමාලවේ චීන අනුවාදය ක්‍රි.ව. 960-1127 අතර කරන ලද්දකි. ඉත්සිංගේ වාර්තා අනුව 7 වන සියවසේ අන්තිම භාගයේ ජාතකමාලාව ඉන්දියාවේ ප්‍රචලිතව පැවති ග්‍රන්ථයකි. අජන්තාවේ ගුහා බිත්තිවල ජාතකමාලවේ ක්ෂාන්තිවාදී, මෛත්‍රීබල, මහාහංස, රුරු, ශිබී, මහාකපි, මහිෂ ආදි ජාතක කථාවලට සම්බන්ධ චිත්‍ර හමු වේ. එම ජාතක සම්බන්ධ ශ්ලෝකද උද්ධෘත කර දක්වා ඇත. ශ්ලෝක ඇතුළත්



ලිපි (අක්ෂර) 6 වැනි සියවසට අයත්ය. මේ අනුව පැහැදිලි වන දෙයක් නම් 5 වැනි සියවස තෙක් ජාතකමාලාව ප්‍රසිද්ධියට පත්ව තිබූ බවයි. ආයීශූර කර්මවිපාක පිළිබඳ සූත්‍ර රැසක් ලියා තිබූ බව කියනු ලැබේ. ඒවායේ චීන අනුවාද ක්‍රි.434 දී සිදුකර ඇතැයි ද සැලකේ. ජාතකමාලාවේ භාෂාව අධ්‍යයනය කිරීමෙන් නලිනාක්ෂ දත්ත - ආයඝීශූර 3 වන හෝ සිව්වන සියවස් වලට සමීප කාලයක විසුවෙකැයි සඳහන් කරයි.[34]

බුද්ධ දේශනා පාණිනී සම්මත සංස්කෘත භාෂාව උපයෝගී කොටගෙන පළමු වරට රචනා කිරීමේ ගෞරවය හිමිවන්නේ ආයඝීශූරටයි. හෙතෙම සාහිත්‍ය, දර්ශන, අලංකාර සහ ඡන්දස් ශාස්ත්‍රයෙහි ප්‍රවීණයෙක් විය. ජාතකමාලාවෙහි ඡන්දස් 27 ක ප්‍රයෝග දක්නට ඇත. ඔහුගේ රචනා විලාසයෙන් ප්‍රකට වන්නේ තෙමේ දයාලු ස්වභාවයේ පුද්ගලයෙකු වූ බවයි. ටිබැට් ජාතික ප්‍රසිද්ධ ඉතිහාසකාර තාරනාථගේ ප්‍රකාශය අනුව වරෙක ආර්යශූර බුද්ධ භක්තිය නිසා ස්වකීය රුධිරයෙන් ශ්ලෝක 70 කින් ස්තුතියක් රචනා කළ අයෙකි. ආයඝීශූරගේ පහත සඳහන් කෘති ප්‍රසිද්ධියට පත්ව ඇත.

ජාතකමාලා, සුභාෂිතරත්න කරණ්ඩක කථා, පාරමිතාසමාස ඒ ග්‍රන්ථයි. මේවාට අමරතරව හුදෙක් ටිබැට් අනුවාදයක සඳහන් ආයඝීශූර කෘති තුනක් පමණ වේ. (ටෝහෝකෝ සූචිය) ඒ ග්‍රන්ථ නම්, ප්‍රාතිමොක්ෂ සූත්‍රපද්ධති, බොධිසත්ත්වජාතක ධර්මගණ්ඩී, සුපථනිර්දෙශපරිකථාත් ය. තවත් විද්වතුන්ට අනුව මේ ග්‍රන්ථවලට අතිරික්ත තවත් ආයඝීශූරකෘති පැවතුණි. පී. එල්.වෛද්‍ය විසින් සංස්කරණය කරන ලද ජාතකමාලාවේ භූමිකවේ, දිව්‍යාවදානයේ 38 වැනි අවදානය වන මෛත්‍රීකන්‍යක අවදානය ආයඝීශූරගේ රචනය කැයි පවසා ඇත.

ගද්‍ය පද්‍යාත්මක චම්පූ ශෛලියෙන් ලියන ලද ජාතකමාලාව බුදුරදුන්ගේ කීර්ති ශ්ලෝක සහ අතිඋත්තම චරිත ලක්ෂණයන් ඇසුරු කරගත් මනෝහර සංකලනයකි. ආයඝීශූරයන්ගේ කෝමල කාන්ත පදවලිය ග්‍රන්ථයේ රසවත් බව සනාථ කරන්නකි.

මෙය සරල සංස්කෘතයෙන් ප්‍රසාද ගුණ උද්දීපනය කෙරෙන පද්‍යයකි. ජීවිතයක් සන්මාර්ගීයෙහි යෙදවීම මෙහි උපදෙස්වල ලක්‍ෂ්‍යයයි. මේ ග්‍රන්ථයේ භාෂා ශෛලිය බෞද්ධ නොවන සාහිත්‍යකරුවන් පවා ආදර්ශ කොට ගෙන ඇත. බෞද්ධ සංස්කෘත සාහිත්‍යයේ ආභාසය ද මේ ග්‍රන්ථයේ නොඅඩුව දක්නට ඇත. ජාතකමාලාවේ ගද්‍ය සහ පද්‍ය ශෛලීන් අතර ඇති භින්නතාව ස්පෂ්ට වුවකි. මෙහි ගද්‍ය කොටසට ලලිතවිස්තරයේ ආභාසය නොඅඩුව ලැබී ඇත. මෙහි පද්‍යයන්හි පාළි සාහිත්‍යයේ සෙවනැල්ල ඉස්මතු වී පෙනේ. සංස්කෘතයේ අශුද්ධ රූපයන්ද විරල වශයෙන් හෝ විද්‍යමාන වේ. කතුවරයා තම ගද්‍ය ශෛලියේ අමුතු මෝස්තර ඉදිරි පත් කිරීමට යත්න දරා නැත. සෑම තැන එක සමාන අල්පසමාස යුක්ත ගද්‍ය ප්‍රවාහයක් වේ. සංක්ෂිප්තව දක්වතොත් ජාතකමාලාව එක් කලා කරුවෙකුගේ කෘතියකි. දේශනා ශෛලිය උපයෝගී කොටගත් ධර්මදේශනා සමූහයක් සරලව ඉදිරිපත් කිරීමකි.

ජගදීශ චන්ද්‍ර මිශ්‍රගේ ජාතකමාලා
සංස්කරණ භූමිකාව ඇසුරෙනි.

**අධොලිපි.**

1 කර්න්, ජාතකමාලා, සංස්කරණය, ප්‍රස්තාවනා පි.10.

2. ජාතකමාලා පරශුරාම් ශර්මා, ප්‍රස්තාවනා පි.12 .

3. බලන්න - ඉත්සිං (ක්‍රි. සත්වන සියවස) තකකුසු, ඉත්සිං ගේ වාර්තා, පි.63.

4. චුල්ලනිද්දෙස, 2-80

5. ශ්‍රීධර වාසුදේව සෝහනී, ජා.කා.භා.සා.පි.5.

6. මිලින්දපඤ්හ - 39 පිට. - කින්තිම හාරාජ ඉදං දුක්ඛං නිරුජ්ඣෙය්‍ය අඤ්ඤං ච දුක්ඛං න උප්පජ්ජෙය්‍යාති, එවදත්ථා මහාරාජ පබ්බජ්ජා අනුපාදපරිනිබ්බාණං.

7. The Bodhisatva doctrine was promulgated by some Buddhist leaders as a protest against this lack of true spiritual fervouer and altruism among the marks of that period - Hardayal, Bodhisattva Doctrine, page 3.



8. M. Williams Samskrit - English Dictionary p. 688 b. - "One who has Bodhi or perfect wisdom as his essence."

9. ශතසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා. පි. 2,

10. බෝධිචර්යාවතාරපංජිකා, පි. 421

11. සතසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා, පි.2, ටිප්පණි 3

12 Sanskrit - English Dictionary, M.W.P. 1052 "Strength, energy, vigour, power, Courage

13. Manual p.65, Note 5, "Histoise" 1,383,Note, H. Kern.

14 නෛරාත්ම්‍ය පරිපෘච්ඡා සූත්‍ර, 12-18

15 ජාතකමාලා, ක.3, ශ්.10-12

16. එම 3/17 - 18

17. ශිබි, කුල්මාෂපිණ්ඩි, මෛත්‍රීබල, විශ්වන්තර, යඥ, උන්මාදයන්ති, සුතසෝම, අයෝගෘහ.

18. බ්‍රාහ්මණජාතක,

19. බිස, වඩ්ඪබොධිජාතක

20 අගස්ත්‍ය, ක්ෂාන්තිජාතක

21 මහාබෝධිජාතක

22 ශ්‍රෙෂ්ඨී, අවිසහ්‍යජාතක

23 සුපාරග ජාතක

24 ශක්‍ර, කුම්භජාතක

25 ව්‍යාඝ්‍රීජාතක

26 ශශජාතක

27 මත්ස්‍යජාතක

28 ශරභ, රුරුජාතක

29 මහාකපි ජාතක

30 ව්‍යාඝ්‍රීජාතක

31 ශිබිජාතක

32 ශ්‍රේෂ්ඨී ජාතක

33 බිසජාතක

34 බෝධිසත්ත්ව භූමි - හැඳින්වීම. නලිනාක්ෂදත්ත.